**සැලසිනේ රූපවාහිනී ආයතනයේ ගනුදෙනු වාර්තාව - 2019**

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

**1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ආයතනයේ සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | එකතුව 174,241 ක් වූ මාස 6 ඉක්ම වූ චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 8.2.1 වගන්තිය | එක් එක් වර්ෂයට අදාල ආදායම් අතිරික්තය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ ඉහළ කළමණාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කොට ඉදිරියේදි පියවර ගනු ලබයි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 8.2.2 වගන්තිය | ආයතනය විසින් රු. මිලියන 32 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර එයින් රු. මිලියන 27 ක් ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතු සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii)8.3.3 (අ) වගන්තිය | ප්‍රසාද දීමනා ගෙවීමට සුදුසුකම් ලැබීම සඳහා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන එම වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අගෝස්තු 05 දින එනම්, දින 157 ක ප්‍රමාදයකින් පසු ඉදිරිපත් කර තිබුණද 2018 වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් 2019 වර්ෂයේදී රු.1,816,823 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ප්‍රසාද දීමනා පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරිතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම ගෙවීම් සිදු කරන ලද අතර ඒ සඳහා ඉදිරිපත් කරන ලද ලිපිය මීට අමුණා ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iv) 6.5.3 වගන්තිය | 2017 සහ 2018 වර්ෂවල වාර්ෂික වාර්තා 2020 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ ඇති වූ වසංගත තත්ත්වය මත එම වර්ෂ 2 ට අදාල වාර්තා සභාගත කිරීමට කටයුතු කරනු ලබයි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2000 ජනවාරි 11 දිනැති අංක පිඑෆ්/පිඊ 05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කාර්ය මණ්ඩලය සඳහා අතිරේක දීමනා සහ වෙනත් වර්ගවල ප්‍රතිලාභ ලබාදිමේදි අමාත්‍ය මණ්ඩලයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේදී පැමිණීමේ | 2019 දෙසැම්බර් මස 14 වන දින පැමිණීමේ දීමනාව රු.1000 ක් දක්වා වැඩි කිරීමට අනුමැතිය ලැබුණද එය මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දීමනා වශයෙන් මාසිකව රු.500 බැගින් එකතුව රු.32,500 ක් හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ උපන්දින සාද වෙනුවෙන් රු.16,490 ක් වැය කර තිබුණි. | 2019 නොවැම්බර් මසදි පරිපාලන වෙනස් වීම මත කාර්ය මණ්ඩල සමාජිකයින්ගේ උපන්දින සාද වෙනුවෙන් වෙන් කරන ලද මුදල වැය නොකරන ලදි. | |
| (ඇ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. 2 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්**

**2.2.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 318 ක ණයගැති ශේෂයක් පැවති අතර ඉන් සියයට 30 ක් වසර 5 කට වඩා වැඩි සහ සියයට 23 ක් අවුරුදු 1-5 ත් අතර කාලයක සිට පවතින පැරණි ණයගැති ශේෂ වුවත් එම ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ සහ නෙවිල් ප්‍රනාන්දු රෝහල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවා ඇති අතර ඉදිරියේදී ප්‍රගතියක් ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙනුවෙන් රූපවාහිනි දැන්වීම් 2ක් නිර්මාණය කිරීම සඳහා සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් එම අධිකාරියෙන් රු.4,108,637 ක් අය කර ගෙන තිබූ අතර දැන්වීම් නිර්මාණය කර ගැනීම වෙනුවෙන්, | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

පෞද්ගලික ආයතනයකට රු.3,428,150 ක් ගෙවා තිබුණි. සේවා සැපයුම් ආයතනය තෝරා ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් අනුගමනය කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 අනුව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගැනීමෙන් තොරව, ගිවිසුම්ගත වටිනාකමින් සියයට 50 ක් එනම් රු.1,714,075 ක් අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඊට අමතරව ගිවිසුමේ 2 වන වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව ප්‍රමාදවී ඉටුකිරීම මත සියයට 5 ක් වූ රු.171,407 ක ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

## 2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි සහානාධාර ලබා දීමේ ජාතික උත්සවය සම්බන්ධ දැන්වීම්, පුවත්පත්වල පළ කිරීමට වැය වූ මුදල ඇස්තමේන්තුවෙහි නොදැක්වීම හේතුවෙන් රු.118,238 ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ග්‍රැෆික් හා මුද්‍රණ ආදායම් ඉලක්කයෙන් සියයට 50ක් සහ නිෂ්පාදන ආදායම් ඉලක්කයෙන් සියයට 40ක් පමණක් සපුරා ගෙන තිබූ බවද කළමණාකරන ගිණුම් පද්ධතියක් හඳුන්වාදීමේ කටයුතු නියමිත කාල රාමුව තුළ අවසන් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | ප්‍රවර්ථන වර්ෂයේදි නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබයි. මේ සම්බන්ධයෙන් නැවතත් එම ආයතනය සමඟ සාකාච්ඡා කොට අවසාන තීරණයකට එළඹීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

## 3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමෙන් තොරව ක්‍රියාකාරී සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි. එමෙන්ම සෑම මුදල් වර්ෂයක් ආරම්භ විමට  දින 15කට පෙර අදාල සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල  අනුමැතිය ලබා ගත යුතු වුවත් අදාල අනුමැතිය ලබා ගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කර ඇති අතර, 2019 දෙසැම්බර් මාසයේ සිට 2020 දෙසැම්බර් මාසය දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොවුයෙන් මෙම වාර්තා දෙක සම්මත කර ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 අයවැය ලේඛනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, අනුමත කරන ලද වාර්ෂික අයවැය ලේඛනය සමඟ අයවැය ගත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි පවතින අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |